(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක. 61.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

## 2010 දෙසැම්බර් මස 07 වැනි අඟහරුවාදා පූ. භා. 9.30 ට

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0231/'10

1.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) හම්බන්තොට දිස්ත්‍රික්කයේ, තංගල්ල කලාප අධ්‍යාපන කාර්යාලයට අයත්, තංගල්ල කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන රජයේ පාසල්වල යටිතල පහසුකම් සහ පොදු අවශ්‍යතාවයන්ගේ ඌනතාවයන් පවතින බැව් එතුමා දන්නෙහිද?

(ආ) (i) එම පාසල් පද්ධතිය තුළ ඇති විදුලිය නොමැති පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල්වල නම් කවරේද;

(iii) එම පාසල් පද්ධතිය තුළ ඇති විදුලිය නොමැති ගුරු නිවාස සංඛ්‍යාව කොපමණද;

(iv) ඒවා අයත් පාසල්වල නම් කවරේද;

(v) ලී බඩු අවශ්‍යතා ඇති පාසල් සංඛ්‍යාව කොපමණද;

(vi) එම අවශ්‍යතාවන් කවරේද;

(vii) විද්‍යාගාර සහ පුස්තකාල නොමැති පාසල් සංඛ්‍යාව කොපමණද;

(viii) එම පාසල්වල නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) ඉහත සඳහන් අවශ්‍යතා ඉටුකරලීමට අවශ්‍ය ප්‍රතිපාදන එම පාසල් සඳහා වෙන් කර දීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඒ කොපමණ කාලයක් තුළදී ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0314/’10

2.

ගරු රවී කරුණානායක මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මෙරට රජයේ පාසල් සහ රජයට අනුබද්ධිත පාසල්වල සේවය කරන ඉංග්‍රීසි ගුරුවරු සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ට මසකට ගෙවනු ලබන මුදල කොපමණද;

(iii) ඔවුන්ට හිමිවන අනෙකුත් ප්‍රතිලාභ කවරේද;

(iv) ශ්‍රී ලංකාවේ ඉංග්‍රීසි ගුරු අවශ්‍යතාව එක් එක් දිස්ත්‍රික්කය අනුව කොපමණද;

(v) ඉංග්‍රීසි ගුරුවරුන්ගේ හිඟය මගහරවා ගැනීම පිණිස ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලාංකික ඉංග්‍රීසි ගුරුවරුන් 2000 කොරියාවට යැවිය යුතු යැයි එතුමා විසින් යෝජනාවක් හෝ ප්‍රකාශයක් කිරීමට හේතු කවරේද;

(ii) එසේ කිරීමෙන් ශ්‍රී ලංකාවට ලැබෙන ප්‍රතිලාභ කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0712/'10

3.

ගරු දයාසිරි ජයසේකර මහතා,— වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගිංගඟ යෝජනා ක්‍රමය නමින් වැඩ සටහනක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබේද;

(ii) එසේ නම් එයට යටත් වන ප්‍රදේශ සහ අවදානම් ප්‍රදේශ කවරේද;

(iii) එම ප්‍රදේශවල අවතැන්වන ජනතාව සම්බන්ධයෙන් ගන්නා ක්‍රියා මාර්ග කවරේද;

(iv) ඔවුන් නැවත පදිංචි කිරීමට බලාපොරොත්තුවන ප්‍රදේශ කවරේද;

(v) ඔවුන් වෙනුවෙන් වන්දි ලබා දීමේ පදනම කුමක්ද;

(vi) ගිංගඟ යෝජනා ක්‍රමය ආරම්භ කරන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0830/'10

4.

ගරු වික්ටර් ඈන්ටනි මහතා,— ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ධීවර ප්‍රජාවට උසස් සමාජ තත්වයක් ලබාදීම සඳහා ධීවර සම්පත් වර්ධනය කිරීම, ධීවර පහසුකම් වැඩි දියුණු කිරීම, අලෙවි පහසුකම් සලසා දීම සහ ධීවර ජනතාවගේ සකසුරුවම්කම පිළිබඳව දැනුම වර්ධනය කිරීම ආදි කටයුතු සම්බන්ධයෙන් වැඩ සටහන් ආරම්භ කර තිබේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) වාරකන් කාලයේදී ධීවර ජනතාවගේ ආර්ථිකය තිරසාරව පවත්වා ගැනීම සඳහා ගෙන ඇති විකල්ප ක්‍රියා මාර්ග කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) කරවල වේලීම, ජාඩි දැමීම, සත්ව ආහාර නිෂ්පාදනය සඳහා මසුන් සැකසීම, තල් කොළ භාණ්ඩ සැකසීම, මැහුම් කටයුතු සහ සිප්පිකටු විසිතුරු භාණ්ඩ නිෂ්පාදනය වැනි ජීවනෝපායන් සඳහා ධීවර කාන්තාවන් පුහුණු කිරීමේ වැඩ පිළිවෙළක් ආරම්භ කර තිබේද ;

(ii) එම නිෂ්පාදන අලෙවිය සඳහා වැඩ පිළිවෙළක් සකස් කර තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0232/'10

5.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) හම්බන්තොට දිස්ත්‍රික්කයේ, වලස්මුල්ල කලාප අධ්‍යාපන කාර්යාලයට අයත්, කටුවන කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන රජයේ පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල්වල නම් කවරේද;

(iii) එම පාසල්වලින් දැනට වසා ඇති හෝ වැසීමට තීරණය කර ඇති පාසල් සංඛ්‍යාව කොපමණද;

(iv) එම පාසල්වල නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙම කොට්ඨාසයට අයත් පාසල්වල අතිරික්ත ගුරුවරුන් සිටින්නේද;

(ii) එම පාසල්වල නම් කවරේද;

(iii) ගුරු ඌනතා ඇති පාසල් වල නම් කවරේද;

(iv) ඌනතාවයන් පවතින්නේ කුමන විෂයයන් සඳහාද;

(v) මෙම ගුරු ඌනතා පවතින පාසල් සඳහා ගුරුවරුන් ලබාදීමට කටයුතු කරන්නේද;

(vi) එසේ නම් ඒ කොපමණ කාලයක් තුළදී ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0445/'10

6.

ගරු රවී කරුණානායක මහතා,— විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) මේ දක්වා වූ පසුගිය වර්ෂ පහක කාලය තුළ එක් එක් වර්ෂයේදී විදේශ රැකියා සඳහා පිටත්ව ගිය පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) රැකියා සඳහා විදේශගත වන පුද්ගලයන් රක්ෂණ සැලැස්මක් තුළින් ආරක්ෂා කළ යුතු බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) එසේ නම්, එවැනි රක්ෂණ ආවරණයක් සඳහා එක් පුද්ගලයකුගෙන් කොපමණ මුදලක් අයකරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) පසුගිය වර්ෂ 5 තුළ එක් එක් වර්ෂයේදී ඉල්ලා සිටි රක්ෂණ හිමිකම් සංඛ්‍යාව කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) රක්ෂණ ගිවිසුම සඳහා මුදල් ගෙවා තිබුනද, රක්ෂණ හිමි පුද්ගලයන්ට හිමිකම් නොලැබීමට හේතු කවරේද යන්න එතුමා පැහැදිලි කරන්නෙහිද?

(ඊ) නොඑසේ නම්, ඒ මන්ද?

0713/'10

7.

ගරු දයාසිරි ජයසේකර මහතා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) හම්බන්තොට වරාය විවෘත කිරීමේ කරදියවර මංගල්‍යය නම් උත්සවය සඳහා වැය කළ මුළු මුදල කොපමණද;

(ii) එම උත්සවයේ ප්‍රසාංගික කටයුතු භාරව ක්‍රියා කළ පුද්ගලයාගේ හෝ ආයතනයේ නම කවරේද;

(iii) එම කටයුතු ඉටු කරන ලද්දේ ආයතනයක් විසින් නම්, එහි ප්‍රධානියාගේ සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ නම් කවරේද;

(iv) එම ආයතනයට හෝ පුද්ගලයාට ගෙවන ලද මුළු මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0831/’10

8\.

ගරු වික්ටර් ඇන්ටනි මහතා,— ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කරදිය සහ කළපු ආශ්‍රිතව මසුන් ඇල්ලීම සඳහා තහනම් දැල් භාවිතය නිසා සිදුවන මත්ස්‍ය පැටවුන් විනාශය හේතුවෙන් මත්ස්‍ය සම්පත් අඩුවී ඇති බවත්;

(ii) ඒ හේතුවෙන් ධීවර කාර්මිකයින්ට ප්‍රමාණවත් මත්ස්‍ය සම්පත් නෙලා ගැනීමට නොහැකි වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) දැනට භාවිත වන සියලුම තහනම් දැල් වර්ග අත්අඩංගුවට ගැනීමට සහ තහනම් දැල් වර්ග භාවිතය සදහටම ඉවත් කිරීම සඳහා ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වැඩසටහන් කවරේද;

(ii) තහනම් දැල් වර්ග භාවිතයට නොගැනීමට හා විනාශ කිරීමට මෙතෙක් ගෙන ඇති ක්‍රියා මාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) කරදිය හා කිවුල් දිය (කළපු) මත්ස්‍යයින් බහුල කරවීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

(ii) තහනම්, අවිධිමත් දැල්ක්‍රම නිසා විනාශ වී ඇති ස්වභාවික මත්ස්‍ය ප්‍රජනන මධ්‍යස්ථාන ආරක්ෂා කිරීමට හා ඒවා වර්ධනය කිරීමට ගෙන ඇති ක්‍රියා මාර්ග කවරේද;

(iii) මත්ස්‍ය ප්‍රජනනය සඳහා විශේෂිත වූ කලාප වෙන් කිරීමට අදහස් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*අ1.

විසර්ජන පනත් කෙටුම්පත (2011) — (දහතුන්වැනි වෙන් කළ දිනය) — කාරක සභාව (දෙසැම්බර් 06 වැනි දින ප්‍රගතිය)

*2.

කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යතුමා,— ස්ත්‍රීන්, තරුණ අය සහ ළමයින් සේවයෙහි යෙදවීමේ පනත යටතේ නියෝග,— 1956 අංක 47 දරන ස්ත්‍රීන්, තරුණ අය සහ ළමයින් සේවයෙහි යෙදවීමේ පනතේ 20 අ වැනි වගන්තියේ සඳහන් මාර්ගෝපදේශවලට අනුකූලව එකී පනතේ 20 අ වැනි වගන්තිය සමග කියවිය යුතු 31 වැනි වගන්තිය යටතේ කම්කරු සබඳතා සහ ඵලදායිතා ප්‍රවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2010 අගෝස්තු මස 20 වැනි දිනැති අංක 1667/41 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2010.11.09 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතුය.

*3.

ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමා,— මැනුම් පනත යටතේ නිවේදනය,— 2002 අංක 17 දරන මැනුම් පනතේ 41 වැනි වගන්තිය සමග කියවිය යුතු, එම පනතේ 65 වැනි වගන්තිය යටතේ ඉඩම් අමාත්‍යවරයා විසින් අනුමතකර 2005 නොවැම්බර් මස 23 වැනි දින අංක 1420/20 දරන ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ "2005 ඉඩම් මැනුම් සභා (වෘත්තියේ යෙදීමේ වාර්ෂික බලපත්‍ර)" නියෝගයේ 3 වැනි ඡේදය සංශෝධනය කිරීම සඳහා 2009 දෙසැම්බර් මස 18 වැනි දින අංක 1633 දරන ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2010.10.19 වැනි දින ඉදිරිපත් කරන ලද නිවේදනය අනුමත කළ යුතු ය.

*4.

ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමා,— මැනුම් පනත යටතේ නිවේදනය,— 2002 අංක 17 දරන මැනුම් පනතේ 39 වැනි වගන්තිය සමග කියවිය යුතු, එම පනතේ 65 වැනි වගන්තිය යටතේ ඉඩම් හා ඉඩම් සංවර්ධන, ජනාවාස හා රණවිරු සුහසාධන අමාත්‍යවරයා විසින් අනුමතකර 2005 නොවැම්බර් මස 23 වැනි දින අංක 1420/20 දරන ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ "2005 ඉඩම් මැනුම් සභා (ලියාපදිංචි කිරීමේ)" නියෝගයෙහි 2(2) වැනි ඡේදය සංශෝධනය කිරීම සඳහා 2010 අප්‍රේල් මස 12 වැනි දින අංක 1649/3 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2010.11.09 දින ඉදිරිපත් කරන ලද නිවේදනය අනුමත කළ යුතුය.

*5.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනාව,— 2008 අංක 43 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, වැඩබලන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයා විසින් දෙන ලද පහත දැක්වෙන අංක 27 දරන නියමය අනුමත කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

## 2008 අංක 43 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 27 දරන නියමය

වැඩ බලන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍ය, සරත් අමුණුගම වන මම, 2008 අංක 43 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එකී පනතේ තෙවැනි උපලේඛනයේ විෂය අංක: 21302 "පොත් මුද්‍රණය, ප්‍රචාරණය හා අලෙවිය අත්තිකාරම් ගිණුම — අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව" වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මගින් වෙනස් කරමි.

| | | | |
|---|---|---|---|
| (i) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | සංශෝධන නොමැත | |
| (ii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | රු. 2,400,000,000<br>රු. 2,162,000,000 | සිට<br>දක්වා |
| (iii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල හර ශේෂයන්ගේ උපරිම සීමාව | සංශෝධන නොමැත | |

(iv) එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව — රු. 100,000,000 සිට රු. 960,000,000 දක්වා

(මෙම නියමය වලංගු වන්නේ 2009.12.31 වැනි දින දක්වා පමණි)

අත්සන් කළේ/ ආචාර්ය සරත් අමුණුගම,
වැඩ බලන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා.

2010.07.03 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත)

*6.

ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමා,— හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ නියෝග,— 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 60 සහ 62 වැනි වගන්ති සමඟ කියවිය යුතු, එකී පනතේ 67 වැනි වගන්තිය යටතේ ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2009 අගෝස්තු 24 දිනැති, අංක 1616/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2010.05.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*7.

බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම

*8.

රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම

*9.

පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම

*10.

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම

*11.

පීඩාකාරී ආයුධ (සංශෝධන) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම

*12.

සමථ මණ්ඩල (සංශෝධන) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම

13.

පින සංවිධානය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම

14\.

ශ්‍රී ලංකාවේ සැමට සෙත පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම

15\.

මහේෂ්වරී පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**

## දිනට නියමිත කටයුතුවලට අදාළ සංශෝධන පිළිබඳ දැනුම්දීම

අ1.

විසර්ජන පනත් කෙටුම්පත (2011) නැමැති පනත් කෙටුම්පතට කාරක සභාවේදී ඉදිරිපත් කරන සංශෝධන සඳහා වෙනම නිකුත් කළ "දිනට නියමිත කටයුතුවලට අදාළ අතිරේකය" නමැති පත්‍රිකාව බලන්න.